"ජනතා හිතවාදී හා ඵලදායී රාජ්‍ය සේවයක් උදෙසා"

ආණ්ඩුකාර ලේකම් කාර්යාලය - දකුණු පළාත
ஆளுநர் செயலகம் - தென் மாகாணம்
Governor's Secretariat - Southern Province

| මගේ අංකය / எனது இல. / My Number | GS/SP/1/1/01-II | ඔබේ අංකය / உமது இல. / Your Number | | දිනය / திகதி / Date | 2025.12.19 |
|---|---|---|---|---|---|

22 DEC 2025

ප්‍රධාන ලේකම්,
ප්‍රධාන ලේකම් කාර්යාලය,
දකුණු පළාත.

**පළාත් සභා මුල්‍ය රීති 562 ප්‍රකාරව දකුණු පළාත් සභාව සඳහා චක්‍රලේඛ අදාළ කර ගැනීම**

ශීර්ෂගත කරුණ සම්බන්ධව, ඔබගේ අංක: CSS/03/13/CIR.COM.(3) හා 2025.12.11 දිනැති ලිපිය හා බැදේ.

02. එකී ලිපිය අනුව දකුණු පළාත් සභා මූල්‍ය රීති 562 ප්‍රකාරව, ඔබ විසින් ඉදිරිපත් කර ඇති කමිටු නිර්දේශය හා ඔබගේ නිර්දේශය පරිදි පහත සඳහන් චක්‍රලේඛය දකුණු පළාත් සභාවට අදාළ කර ගැනීම සඳහා 2025.12.18 දිනැතිව ගරු ආණ්ඩුකාරතුමිගේ අනුමැතිය ලබා දී ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

| අනු අංකය | නිකුත් කළ ආයතනය | අංකය හා නිකුත් කළ දිනය | චක්‍රලේඛයේ ශීර්ෂය |
|---|---|---|---|
| 01. | රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 14/2022 (V)<br>2025.12.05 | ජ්‍යෙෂ්ඨතාවට හා විශ්‍රාම වැටුපට හානියක් නොවන පරිදි රාජ්‍ය නිලධරයන්ට දේශීය / විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා දීම. |

03. ගරු ආණ්ඩුකාරතුමිය විසින් අනුමත කරන ලද, ඉහත සඳහන් කරන ලද චක්‍රලේඛයෙහි පිටපතක් මේ සමග ඔබ වෙත කාරුණිකව යොමු කරමි.

එච්.ඩී.ඩී.එස්.ඩබ්. හේරත්
සහකාර ආණ්ඩුකාර ලේකම්,
ආණ්ඩුකාර ලේකම් වෙනුවට,
දකුණු පළාත.

එච්.ඩී.ඩී.එස්.ඩබ්.හේරත්
සහකාර ලේකම්
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
දකුණු පළාත

ලිපිනය: පහළ ඩික්සන් පාර, ගාල්ල. | முகவரி: கீழ் டிக்சன் வீதி, காலி. | Address: Lower Dikson Road,Galle.
දුරකතන/ෆැක්ස්: 091-2234480 | தொலைபேசி/தொலைநகல்: 091-2234480 | Telephone/Fax: (+94)91-2234480
ඊ-මේල්: governsecspc@sltnet.lk | மின்-அஞ்சல்: governsecspc@sltnet.lk | e-mail: governsecspc@sltnet.lk
වෙබ් අඩවිය: governor.sp.gov.lk | இணையதளம்: governor.sp.gov.lk | e-mail: governor.sp.gov.lk

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 14/2022(V)

මගේ අංකය : EST-6/03/LEA/3162(4)
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2025.12.05

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## ජ්‍යෙෂ්ඨතාවට හා විශ්‍රාම වැටුපට හානියක් නොවන පරිදි රාජ්‍ය නිලධරයන්ට දේශීය/ විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා දීම

උක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2022.06.22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022, 2022.09.06 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022(I), 2022.09.15 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022(II), 2023.07.13 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022(III) හා 2024.06.07 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022(IV) කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. පහත සඳහන් විධිවිධානයන්ට යටත්ව ඉහත චක්‍රලේඛ විධිවිධාන යටතේ දේශීය/ විදේශීය නිවාඩු අනුමත කිරීම වහාම ක්‍රියාත්මක වන පරිදි නතර කිරීමට 2025.11.24 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

2.1 දැනට 2022.06.22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ විධිවිධාන අනුව දේශීය/ විදේශීය නිවාඩු ලබා සිටින නිලධරයන් සඳහා දැනට අනුමත කර ඇති නිවාඩු කාලසීමාවට පමණක් අදාළ වන පරිදි එම නිවාඩුව ලබා ගැනීමට අවස්ථාව ලබා දීම.

2.2 දැනට දේශීය/ විදේශීය නිවාඩු අනුමතිය ලබා එම නිවාඩුව ගත කිරීම අපේක්ෂාවෙන් සිටින නිලධරයන්ට ඉහත චක්‍රලේඛ විධිවිධාන අනුව දැනට අනුමත කර ඇති කාලසීමාවට අදාළ වන පරිදි එම නිවාඩුව ලබා ගැනීමට අවස්ථාව ලබා දීම.

2.3 විදේශ නිවාඩු ලබා ගැනීම සම්බන්ධයෙන් පමණක් පහත පරිදි කටයුතු කිරීම.

2.3.1 2022.06.22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 හි “ක” වගන්තියෙහි සඳහන් අමාත්‍යාංශ කමිටුව වෙත දැනට ඉදිරිපත් කර ඇති සියලු අවශ්‍යතා සපුරා ඇති නව නිවාඩු අයදුම්පත්‍ර/ නිවාඩු දීර්ඝ කිරීමේ අයදුම්පත්‍ර සඳහා නිවාඩු අනුමත කිරීම සහ නිවාඩු දීර්ඝ කිරීම.

මෙම රාජ්‍ය පරිපාලන/ රාජ්‍ය ... චක්‍රලේඛ ... අංක 14/2022 (V) ... චක්‍රලේඛය / උපදෙස්
ලිපිය 2025.12.05 දින සිට
... 2025.12.18
... දින ලබා දී ඇති බව සහතික කරමි.
එච්.ඩී.ඩී.එස්.ඩබ්.හේරත්
සහකාර ලේකම්
ආණ්ඩුකාර ලේකම් / සහකාර ලේකම්
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
දකුණු පළාත

2.3.2 සියලු අවශ්‍යතා සම්පූර්ණ කර නොමැති මෙන්ම ඉදිරිපත් කළ යුතු ලිපිලේඛනවල අඩුපාඩු සහිතව ඉදිරිපත් කර ඇති නව නිවාඩු අයදුම්පත්‍ර/ නිවාඩු දීර්ඝ කිරීමේ අයදුම්පත්‍ර නැවත සලකා බැලීමකින් තොරව ප්‍රතික්ෂේප කිරීම.

2.4 ඉහත 2.3 යටතේ නිවාඩු අයදුම්පත්‍ර සඳහා අනුමතිය ලබා දීමේ කටයුතු 2025.12.31 දිනට පෙර අවසන් කිරීම.

2.5 දේශීය නිවාඩු සඳහා ඉදිරිපත් කර ඇති නිවාඩු අයදුම්පත්‍ර සඳහා අනුමතිය ලබා නොදීම.

2.6 නව නිවාඩු අයදුම්පත්‍ර හෝ නිවාඩු දීර්ඝ කිරීමේ අයදුම්පත්‍ර බාර ගැනීම වහාම ක්‍රියාත්මක වන පරිදි නතර කළ යුතු අතර, 2026.01.01 දිනෙන් පසු 2022.06.22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ විධිවිධාන අනුව රජයේ නිලධරයන්ට නිවාඩු අනුමත නොකිරීම.

මෙම රාජ්‍ය පරිපාලන/ රාජ්‍ය... චක්‍රලේඛ අංක: 14/ 2022 (V)... චක්‍රලේඛය / උපදෙස් මිලය ...2025.12.05... දින සිට දකුණු පළාත් සේවාවට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය...2025.12.18.... දින ලබා දී ඇති බව සහතික කරමි.

.................................................

ආණ්ඩුකාර ලේකම් / සහකාර ලේකම් / සහ/නි.

එච්.ඩී.ඩී.එස්.ඩබ්.හේරත්
සහකාර ලේකම්
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
දකුණු පළාත

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය


දුරකථන : 011-2699399
ෆැක්ස් : 011-2692158
විද්‍යුත් ලිපිනය : ade-vi@pubad.gov.lk